# ශ්‍රී ලංකාවට තෙල් ලැබුනොත්.....



*මිලියන 18 වඩා අධික ජනගහණයක් වෙසෙන අපේ කුඩා දිවයින මීට පෙර ඉන්දියාව, ඕස්ට්‍රේලියාව හා අප්‍රිකාව එක්ව එකම මහද්වීපයක් ලෙස පැවැති බව විශ්වාස කෙරේ. අවුරුදු මිලියන ගණනකට පෙර පැවැති එම මහද්වීපය එලෙසම පැවැතුනා නම් අද අපි කුමන ජාතියකට අයත් මිනිසුන් වේද? කුමන භාෂාවකට, ආගමකට අයත් මිනිසුන් වේද?*




ශ්‍රී ලංකා මුහුදු සීමාවට දකුණින් මන්නාරම් මුහුදු ද්‍රෝනියේ තෙල් නිධි පවතින බවට පැවති මතය සනාථ කරමින් එහි සැබෑවටම තෙල් නිධි පවතින බවට, දැන් නිශ්චිතවම තහවුරු කරගෙන ඇති බව අපට අසන්නට ලැබුණි. එහෙත් මෙම ගවේෂණ කටයුතු වෙනුවෙන් එදා පැවැති එක්සත් ජාතික පක්ෂ රජය ''නොපෙක්'' නැමැති නෝර්වේ තෙල් සමාගමට තනි අයිතිය ලබාදුනි. එය වසර 2012 වනතෙක්ය. නමුත් එදා මෙම ගිවිසුමට මාධ්‍ය මගින් එල්ල වුණු දැඩි ප්‍රහාර හමුවේත් ආණ්ඩු පෙරළියත් සමගින් පැවැති අහිත කර තත්ත්වයන් හමුවේත්, එම සමාගමට සිදුවූ පාඩුව වෙනුවෙන් පසුව පැවැති රජය ඩොලර් මිලියන 8 ක මුදලක් ඔවුනට ලබාදුනි. එම පාඩුව එසේ පියවුවත්, ඔවුන් තවත් ඩොලර් මිලියන ගණනක් උපයමින් එම දත්ත ඉන්දියානු හා බ්‍රිතාන්‍ය තෙල් සමාගම්වලට විකුණමින් අපේ මුහුදේ සියලු තෙල් රහස් ඔවුන්ට ලබා දී ඇත. තෙල් දැකීමටත් පෙර විශාල මුදලක් පාඩු කරගත් අපි දැන් එම ගවේෂණ කටයුතු භාර දී ඇත්තේ ඉන්දියාවට හා චීනයටය. කොටස්වලට බෙදා ගවේෂණ කටයුතු භාර දි ඇතත්, මෙහි තවත් කොටස් කිහිපයක ගවේෂණ කටයුතු වෙනුවෙන් පැමිණෙන ලෙස වත්මන් ජනාධිපතිවරයා විසින් කුවේට් රටටද ආරාධනා කර ඇත. කුවේටය එයට කැමැත්ත පල කර ඇති බව සැල වුවත්, මේ වනතුරු නම් ගවේෂණ කටයුතු ආරම්භ කර නැත.

අපේ රටේ තෙල් ඇති බවට මුල්ම මතයක් පැවතියේ 71 පැවැති සමඟි පෙරමුණු ආණ්ඩුව සමයේය. එකල පේසාලේ මුහුදු තීරයේ තෙල් ඇති බව සනාථ කරන්නට කල ගවේෂණ කටයුතු වෙනුවෙන් එම රජය විශාල මුදලක් වැය කළේය. ණය ආධාර වශයෙන් වුවත්, එයට දැරූ ධනස්කන්දය ප්‍රතිඵල රහිත විය. එයින් ලැබුණු තෙලක් නැත. එවකට පැවැති විපක්ෂයට මෙය රසබර පරිභෝජනයක් විය. ඔවුන් ඡන්ද වේදිකාවේ පැවසුවේ, පේසාලෙන් තෙල් බෝතල් කාලක්වත් නොලැබුණු බවත්, හැරූ තෙල් ලිංවලට පිටින් බොරතෙල් දමා මාධ්‍යයට පෙන්නා ජනතාව මුලාකල බවත්, පවසමින් ඔවුන් ආණ්ඩුව පතුරු ගැසීය. ඒ වෙනුවෙන් මඩ ගී ද නිර්මාණය කරමින් වේදිකාවල ගායනා කරවීය.

ඊට පසුවද පැවැති රජයන් විසින් අපේ රටේ මුහුදු තීරයේ තෙල් ඇති බවට වරින්වර ජනතාවට ප්‍රකාශ කලත්, නිශ්චිතවම තෙල් ඇති බව සොයගනු ලැබුවේ 2002 වසර කාලයේය.

මිලියන 18 වඩා අධික ජනගහණයක් වෙසෙන අපේ කුඩා දිවයින මීට පෙර ඉන්දියාව, ඕස්ට්‍රේලියාව හා අප්‍රිකාව එක්ව එකම මහද්වීපයක් ලෙස පැවැති බව විශ්වාස කෙරේ. අවුරුදු මිලියන ගණනකට පෙර පැවැති එම මහද්වීපය එලෙසම පැවැතුනා නම් අද අපි කුමන ජාතියකට අයත් මිනිසුන් වේද? කුමන භාෂාවකට, ආගමකට අයත් මිනිසුන් වේද?

එසේම මෙම සම්පත් හිමි වන්නේ කාටද? මෙම මුහුදු හිමි වන්නේ කාටද? මෙම පෘථිවි තලය ගොන්ඩානා සහ අංගාරා ලෙස පැවත පාවී ගොස් ඈදී සිදුවුනු තෙරපීම නිසා රටවල් ලෙස කෑලි කැබලිවලට කඩා කෙතරම් ප්‍රශ්න කන්දරාවක් ලෝකයට අයිති කර දී ඇද්ද. එසේම මනුෂ්‍යයන් මේ පෘථිවි තලය මත මවා කෙතරම් සංකීර්ණ ප්‍රශ්න කෝටියක් මේ ලෝකයට හිමිකර දී ඇද්ද?

ඉතිහාසය එසේ වුවත්, අද රටවල් කැඩි සුනු විසුනු වෙන්නේ කා නිසාද? මේ මිනිසාම නිසාය. අද පෘථිවි තලයේ ඈදීමක් අවශ්‍ය වෙන්නේ නැත. මිනිසා ඒ දේ කදිමට ඉටු කරයි. ඔවුන් එසේ කරන්නේ පෘථිවියේ ඇති මේ සම්පත්වලට ඇති ගිජුකම, තෘෂ්ණාව නිසාය. එම තෘෂ්ණාවෙන් අද මුළු ලෝකයම උණු වී ගිනියම් වෙයි. එයින් නිකුත් වන රුධිර ධාරා බිම් තීරු වෙන් කරයි.

අද ලෝකයේ බොහෝ රටවල් දෙස බැලූ විට අන් හැමටම වඩා අපි ආර්ථික වශයෙන් දුගී රටකි. ධනවාදී බලවතුන්ගේ නෙත් නිතරම අපේ රට වෙත යොමු වන්නේ අපේ මේ මුහුදු තීරයේ ඇති තෙල් සම්පත් නිසා බව බොහෝ මතධාරීන් පවසන දෙයකි. එසේම ඔවුන් අපේ රටේ ජනවාර්ගික යුද්ධයට ඇඟිලි ගසන්නේද මෙම සම්පත් නිසා බව පුන පුනා පවසයි.
එසේ තෙල් හාරා තෙල් ගන්නට යන වියදම තෙල් විකුණා ලබා ගන්නට යන ආදායමට වඩා වැඩි නම්, කුමක් සිදුවේද යන්න කවුරුත් සොයා බලා නැත. එය තවත් පේසාලයක් වේද යන්න තවමත් අපට කිව නොහැක. එහෙත් පහසුවෙන් තෙල් ලැබී, තෙල් විකුණා අපේ රට සුබිත මුදිත කිරීමට පෙර, අපි විසින් මෙම ජනවාර්ගික අර්බුදයට විසඳුමක් ලබාදිය යුතුයි. කෙසේ හෝ මෙහි නිමාවක් දැකිය යුතුය. එසේ නොවුනහොත් අපේ රටේ අනිවාර්‍යයෙන්ම වෙන රටක් බිහිවෙනවාට වඩා බිහි කෙරෙනු ඇත. එසේ කරන්නේ බලවත්, ධනවත් රටවල් විසිනි. කෙටියෙන් කියතොත් තෙල් ලැබුණොත් අපේ රට කැබලි දෙකකට කැඩෙනු ඇත. ඒ අපේ රටේම තෙල් නිසාය. එහෙත් ඒ ගැන සිතන්නට හෝ ධෛර්යය වන්තව විසඳීමට නායකයින් අපට තවමත් ලැබී නැත.

මේ සියලු කාරණා සලකා බැලූ කල පන්සිය පනස් ජාතක පොතේ එන ''අකාලරාවී'' ජාතකයෙන් වැදගත් පණිවිඩයක් අපේ නායකයින්ට ලබාදෙයි. එය නම්, අපිළිවෙලට කටයුතු කරන්නා තමන්ට මෙන්ම අනුන්ටද විපත් හා කරදර ලඟා කර දෙන බවයි.




